දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

1 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට
1[st] Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"For a prosperous future"


මගේ අංකය / எனது இலக்கம் / My No } DSH/DPS/07/DCC/වාර්තා/2025
ඔබේ අංකය / உமது இலக்கம் / You're No }
දිනය / திகதி / Date } 2025.10.08

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - *2025.09.30*</u>**

*2025.09.30* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් විශේෂ සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා ඍඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, 2025.10.29 දිනට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමට යෝජිත හෙයින් ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය 2025.10.22 දිනට හෝ ඊට ප්‍රථම මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

**බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා**
**දිස්ත්‍රික් ලේකම්/දිසාපති**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.**

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

පිටපත්:-
01. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස
02. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර හා හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
03. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස


District Secretary - 047 2256235
Additional District Secretary (Admin) - 047 2256232
Additional District Secretary (Land) - 047 2256002
Chief Accountant - 047 2256246
Director (Agriculture) - 047 3628890
Director (Planning) - 047 2256234
Assistant District Secretary - 047 2256945
Administrative Officer - 047 2256285
Office
Fax - 047 2256235 / 047 2256247
email moha.dist.hambantota@gmail.com
Web site www.hambantota.dist.gov.lk

# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
## 2025.09.30

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා දේශපාලන නායකයින්ගේ මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.09.30 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් මෙන්ම පළාත් පාලන ආයතනවල ගරු නගරාධිපති හා සභාපතිවරුන් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් තුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘතිවල මේ වනවිට ඉලක්කගතව අවසන් ප්‍රගතිය ලගාකර ගැනීමට කටයුතු කරන අවස්ථාවේ පවත්වන සම්බන්ධීකරණ කමිටුව ඉතාමත් වැදගත් බවත් පවසමින් ගරු සම සභාපතිතුමන්ලා වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

ගරු සභාපති තුමා විසින් පැමිණ සිටි සියළුම දෙනා පිලි ගැනීමෙන් පසු පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ජනතාවට උරුම කර දීම සඳහා සියළුදෙනා එක්ව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව පෙන්වා දෙමින් පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් පසු රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යායපත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | 2025.08.27 දිනැති සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම. | | | |
| 1.1 | නවයාලවිල ජලාශය සංවර්ධනය කිරීමේ කෙටි කාලීන පියවර | මෙම ජලාශය සංවර්ධනය කිරීමේ සම්භාව්‍යතාවය අධ්‍යයනය කර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත යොමු කර ඇති අතර එහි නිර්දේශ ඉල්ලා සාමාන්‍යාධිකාරී වෙත යොමු කර ඇති බව බවත් සැලසුම සකස්කරනුයේ මාතර ප්‍රධාන කාර්යාලයෙන් බවටත් කරුණු ඉදිරිපත් විය. | රැස්වීම් වාර කිහිපයකදීම මෙම ගැටළුව සාකච්ඡා කර ඇතත් නිසි විසඳුමක් නොමැති බැවින් මීලග කමිටුවට සවිස්තර කරුණු සහිතව නිර්දේශ වාර්තාව ඉදිරිපත් කරන ලෙස අනිවාර්ය කරන ලදි. | ප්‍රාදේශීය කළමණාකරු ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 1.2 | පරිපාලන සංකීර්ණය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ විදුලි පහන් සවි කිරීම සම්බන්ධව | මෙම කරුණ සාකච්ඡා කරමින් විශාල කාලයක් යොදවා ඇතත් අදාල කාර්ය කරගැනීම මෙතෙක් සිදු නොවීම ගැටලුවක් බවත් එබැවින් මෙය කඩිනම් කලයුතු බවටත් කරුණු ඉදිරිපත් විය.<br>එසේම, බිල් ගෙවීමේ වගකීම මහනගර සභාවට භාරගත නොහැකි බවත් ඒ සඳහා මැදිහත්වීමක් අවශ්‍ය බවටත් කරුණු ඉදිරිපත් විය.<br><br>මෙම විදුලි පද්ධතියේ විදුලි පහන් සවිකිරීම මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදුකර දෙන බවත් ඊට අදාල මාසික බිල මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු නොකරන ලෙසට ඉල්ලීම් කරන ලදි.<br><br>මේ වනවිට වරාය අධිකාරිය මඟින් ගෙවිය යුතු වරිපනම් වාරික දෙකකට යටත්ව ගෙවීම් කරන ලෙස දැනුවත් කර ඇතත් එකී මුදල් මේ වනතෙක් මහනගර සභාවට ගෙවීමට කටයුතු කර නොමැති බවට පැහැදිලි කරන ලදි. | විදුලි බිල්පත මහනගරසභාව නමින් ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>මෙම වරිපනම් මුදල් ගෙවීමේ කටයුතු කඩිනම් කරන ලෙස අවධාරණය කරන ලදි. | පළාත් පාලන කොමසාරිස්<br><br>නාගරික කොමසාරිස් හම්බන්තොට ම.න.ස<br><br>නාගරික කොමසාරිස්, හම්බන්තොට<br><br>වරාය කළමනාකරු |



දිස්ත්‍රික් ලේකම් / දිසාපති හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.3 | වරායට නැව් මගින් පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සැපයීම | මෙකී සංචාරකයින් සඳහා පහසුකම් සැපයීම සම්බන්ධව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්ගේ මූලිකත්වයෙන් කීප අවස්ථාවක් රුහුණු සංචාරක කාර්යාංශය, සංචාරක සංවර්ධන අධිකාරිය හා අනෙකුත් අදාල අංශ එක්ව සාකච්ඡා කලද ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කිසිවක් සිදුනොවුන බවත් මෙය රුහුණු සංචාරක කාර්යාංශයේ වගකීමක් බවත් වැඩිදුරටත් සාකච්ඡා විය. | අදාල අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් විධිමත් සැලැස්මක් සකස් කර මේ සඳහා කඩිනම් පියවර ගන්නා ලෙසත් ගන්නා ලද ක්‍රියාමාර්ග වාර්තා කරන ලෙසටත් උපදෙස් දෙන ලදී. | ලේකම්,<br>ප්‍රධාන අමාත්‍යාංශය, දකුණු පළාත<br><br>සභාපති,<br>රුහුණු සංචාරක කාර්යාංශය<br><br>ප්‍රධාන ඉංජිනේරු,<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම්,<br>හම්බන්තොට<br><br>කළමනාකරු,<br>හම්බන්තොට වරාය |
| 1.4 | දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද සියළු ව්‍යාපෘති සම්බන්ධව දැනුවත් කිරීම. | මෙකී ව්‍යාපෘතිය ක්‍රියාත්මකවූ හම්බන්තොට, තිස්සමහරාම, සහ සූරියවැව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිදුකරන ලද වැඩකොටස් මගින් ඉලක්කගත ප්‍රගතියකරා ලගාවී තිබේද? යන්න සාකච්ඡාවට ලක්විය. | මෙම වැඩකොටස් නිරීක්ෂණය සඳහා ස්ථානීය පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය බවත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලෙසත් පවසන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ,<br>දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය |
| 1.5 | මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය පිහිටි ටවර්හිල් ප්‍රදේශය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමට යෝජනා කිරීම | ටවර්හිල් ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකරන ව්‍යාපෘතියක් බවත් මේ වන විට මීට අදාල යෝජිත ඉඩම ප්‍රාදේශීය ලේකම් යටතේ පවතින අතර නාගරික සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි මෙකී ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට කටයුතු කරමින් බවටත් කරුණු ඉදිරිපත් විය. | අදාල බිම් කොටස් නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමේ කටයුතු කඩිනම් කරන ලෙසත් රුහුණු සංචාරක කාර්යාංශයත් එක්කරගනිමින් වරින් වර ගැටළු ස්මතු නොවීමට වගකීම ගෙන නගර සැලසුම සකස්කිරීමේ කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්,<br>හම්බන්තොට<br><br>නියොජ්‍ය අධ්‍යක්ෂ,<br>නාගරික සංවර්ධන අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ,<br>ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය<br><br>කෞතුකාගාර අධිකාරී,<br>ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව. |
| 1.6 | ප.ව. 4.15 න් පසු පරිපාලන සංකීර්ණය ඉදිරිපසින් මගී ප්‍රවාහන බස්රථ ගමන් නොකිරීම. | මෙම කාලයට අදාලව මගී ප්‍රවාහන බස්රථ ප්‍රවාහනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී බස්රථ යෙදවූවත් මගීන් නොසිටී බව සඳහන් කරන ලදී.<br><br>පස්වරුවේ හම්බන්තොට සිට මිද්දෙණිය දක්වා ගමන්ගන්නා ප්‍රවාහන බස්රථය වලස්මුල්ල දක්වා දීර්ඝකර එකී සේවාව ලබා ගැනීමට මගීන් ඉල්ලා සිටින බවත් මිද්දෙණිය සිට පස්වරු 6.15 න් පසු වලස්මුල්ල දක්වා ගමන් පහසුකම් නොමැති වීමෙන් මගීන් අපහසුතාවයට පත්වන බවත් සාකච්ඡා විය. | මගීන් මේ වන විට නොමැති වූවත් එකී සේවාව දිගටම සිදුකරන ලෙසත් ඒ අනුව මගින් මෙම පහසුකම් ලබා ගැනීමට යොමු විය හැකිවේ යැයි උපදෙස් දෙන ලද අතර මිද්දෙණියේ සිට වලස්මුල්ල දක්වා ප්‍රවාහන සේවාව ලබා දීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කරන ලෙස දැනුම් දෙන ලදී. | සභාපති,<br>දකුණු පළාත් මාර්ගස්ථ හා මගී ප්‍රවාහන අධිකාරිය.<br><br>ඩිපෝ කළමනාකරුවන්,<br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය |



දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 02. | අනතුරුව 2025.09.30 දිනට අදාල න්‍යාය පත්‍රයේ කරුණු සාකච්ඡා කරන ලදී. ඒවා පහත පරිදි වේ. | | | |
| 2.1 | සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුවත් කිරීම. | | | |
| 2.1.1 | විමධ්‍යගත අයවැය වැඩසටහන | විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයට අනුමතවූ රු.මි.80ට අදාලව හඳුනාගත් ව්‍යාපෘති 49 න් මේ වන විට ව්‍යාපෘති 26 ක් අවසන්කර භෞතික ප්‍රගතිය 53% ක් අත්කරගෙන ඇති බවත් අතැති බිල් සමඟ රු.මි. 12.64 ක බිල්පත් ඉදිරිපත්ව ඇති බවත් ඒ අනුව මූල්‍ය ප්‍රගතිය 16% ක් බවත් නොවැම්බර් 15 වන විට ව්‍යාපෘති අවසන්කල හැකි බවත් ප්‍රසම්පාදන මට්ටමේ ව්‍යාපෘති 4 ක් පැවතීමට හේතුව අත්‍යාවශ්‍ය සංශෝධන නිසා බවත් ප්‍රකාශ කරන ලදි. | ඉදිරියේදී වැසි සහිත කාලගුණික තත්ත්වය ද සැලකිලිමත් වෙමින් ව්‍යාපෘති කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.1.2 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | පලමු අධියර යටතේ දිස්ත්‍රික්කයට රු.මි. 79.2 ක් අනුමතවූ අතර ඒ වෙනුවෙන් හඳුනාගත් ව්‍යාපෘති 25 න් මේ වන විට 5 ක් අවසන්කර භෞතික ප්‍රගතිය 20% ක් පෙන්නුම්කර ඇතත් එහි මූල්‍ය ප්‍රගතියක් මේ දක්වා නොමැති බවත් ප්‍රකාශ විය.<br><br>දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරණ කමිටුවේදී මාර්ග ව්‍යාපෘති වෙනුවෙන් රු.මි.250 ක් ලබාදී ඇති බවත් එකී ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින තාක්ෂණික නිලධාරීන්ට කාපට් ඇතිරීම සම්බන්ධව අඩු අත්දැකීම් පැවතීම නිසා ඒවා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් රු.මි.139 ක් වූ ව්‍යාපෘති 04 ක් සහ මාර්ග සංවර්ධන අධිකාරිය රු.මි.66 ක ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදි. මාර්ග සංවර්ධන අධිකාරිය එකඟවූ ව්‍යාපෘති වෙනුවෙන් ලබාදී ඇති රු.මි. 66 මෙම දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධනය වෙනුවෙන් ලබාදෙන ලෙස දිස්ත්‍රික් ලේකම් තුමන් මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ග්‍රාමීය මාර්ග) වෙතින් කරනු ලැබූ ඉල්ලීම පරිදි එම ප්‍රතිපාදන වෙනුවෙන් තවත් ග්‍රාමීය මාර්ග 33 ක් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුන බවත් ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු එකඟතාව පරිදි ඉතා ඉක්මනින් එම යෝජනා ලබා දුන් බවත් ඒවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව මේ වන විටත් අමාත්‍යාංශයට යොමු කල බවත් ඒවා අනුමත කර ගැනීම කඩිනම් කර | ග්‍රාමීය මාර්ග සංවර්ධන කටයුතු වලදී පළාත් පාලන ආයතන හා අදාල අංශවල සහයෝගය ලබා ගනිමින් අවබෝධතා ගිවිසුම් යටතේ හෝ ක්‍රියාත්මක කරන ලෙසත් ඒවා කඩිනමින් අවසන් කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>පළාත් පාලන සහකාර කොමසාරිස්, හම්බන්තොට |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ගැනීම සඳහා දිස්ත්‍රික් මාර්ග සංවර්ධන කමිටු ගරු සභාපති දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය සාලිය සඳරුවන් මදරසිංහ මැතිතුමා සුවිශේෂී කාර්යභාර්යයක් ඉටුකල බවද ප්‍රකාශ කරන ලදි.<br>තවද, මෙම රු.මි. 66 ද සමඟ මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මඟින් අනුමත කරනු ලැබූ ව්‍යාපෘති යෝජනා සමඟ මේ වන විට රු.මි. 505.2 ක්වූ විශාල මුදල් ප්‍රමාණයක් යොදවා දිස්ත්‍රික්කයේ මාර්ග පද්ධති සංවර්ධනය කර ගැනීමට අවස්ථාවක් ලැබී ඇති බවත් දන්වන ලදි. | | |
| | | තවද, මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම ප්‍රමාදවීම සහ මාර්ග උරහිස් පිරවීමට පස් ලබා ගැනීමේ ගැටළුවට විසඳුමක් ලබා ගැනීම අත්‍යාවශ්‍ය බවත් දිස්ත්‍රික්කය තුළ මේ වන විට ක්‍රියාත්මකවෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් හා බොරළු සපයා ගැනීමේ අපහසුතාවයක් පවතින බැවින් සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් අවසන් කළ නොහැකි බවටත් කරුණු ඉදිරිපත් විය.<br>එසේම, දිස්ත්‍රික්කය තුළ පවතින්නේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් එක් පරීක්ෂණාගාරයක් බවත් නිලධාරීන්ගේ හිඟය සහ අධික ඉල්ලුම නිසා වාර්තා ලබාදීමේ ප්‍රමාදයක් පවතින බවටත් කරුණු වාර්තා විය. | මාර්ග ව්‍යාපෘති සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා මාතර දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වැලිගම පිහිටි පරීක්ෂණ මධ්‍යස්ථානයේ සහාය ලබා ගන්නා ලෙසත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ලබා දෙන ලෙසත් උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්<br><br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>පලාත් පාලන සහකාර කොමසාරිස්, හම්බන්තොට<br><br>සහකාර අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය |
| | | තවද, ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිතා කරන ඛනිජ කැණීම ප්‍රවාහනය හා වෙළඳාම සම්බන්ධ කාර්ය සංග්‍රහයේ 115 වැනි වගන්තිය අනුව අදාළ සංවර්ධන ව්‍යාපෘති සිදුකරන කොන්ත්‍රාත්කරුවන් හට රජයේ නියමිත ගාස්තු අයකර දිස්ත්‍රික් පරිසර කමිටුව නිර්දේශ කරන කමිටු බලප්‍රදේශයක් තුල පිහිටි ස්ථානයකින් පස් ලබා ගත හැකි බවත් පස් කියුබ් 100 ක් දක්වා බලපත්‍ර නිකුත් කිරීමට ඇති හැකියාව සම්බන්ධවත් වැඩිදුරටත් සාකච්ඡාවට ලක් විය. | සකස්කරනු ලබන මාර්ග ව්‍යාපෘතිවල උරහිස් පිරවීම සඳහා ලබාදී ඇති නිර්නායක පරිදි අවශ්‍යතාවය සලකා බලා පරිසර කමිටුවේ නිර්දේශද සහිතව කියුබ් 100 ක් නිදහස් කිරීමට ලබා දී ඇති අවසරය ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා දෙන ලදි. | |
| 2.1.3 | නිලසෙවන කාර්යාල වල යටිපහසුකම් හා අළුත්වැඩියා කිරීම - 2025 | මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 111 ක් හඳුනාගෙන ඇති අතර ඉන් 41 ක් අවසන්කර ඇති අතර එහි භෞතික ප්‍රගතිය 37% ක් බවත් රු.මි. 84.65 ක් වූ ප්‍රතිපාදන වලින් රු.මි. 5.21 ක් වියදම්කර 6 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇති බවත් දැනුම් දෙන ලදි. | අදාල ව්‍යාපෘති කඩිනම් කරන ලෙස පවසන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br><br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.1.4 | දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන | ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මෑතකදී ලබාදී ඇති රු.මි. 83 ට අදාලව ව්‍යාපෘති යෝජනා 50ක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනාගෙන ඇති බවත් ඉන් ව්‍යාපෘති 08 ක වැඩ ආරම්බකර ඇති බවත් තවදුරටත් ඇස්තමේන්තු සකස්කරන මට්ටමේ ව්‍යාපෘති 06 ක් පවතින බවත් ප්‍රකාශ කරන ලදි. | අදාල ව්‍යාපෘති කඩිනම් කරන ලෙස පවසන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ අදාල ප්‍රාදේශිය ලේකම්වරුන්<br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට / තංගල්ල/ වලස්මුල්ල |
| 2.1.5 | ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | මෙම වැඩසටහන යටතේ වීරකැටිය , හම්බන්තොට , අඟුනකොලපැලැස්ස, තංගල්ල යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වෙතින් ඉදිරිපත් වූ ව්‍යාපෘති යෝජනා 05 ක් වෙනු වෙන් රු.මි. 53.38 ක් ලැබී ඇති බවත් එම ව්‍යාපෘති දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බවත් දැනුම් දෙන ලදි. | අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ තුඩුව වසමේ ක්‍රියාත්මක කිරිමට යෝජිත ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොලැබීම සම්බන්ධව සොයාබලා කඩිනමින් අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 2.1.6 | සංචාරක සංවර්ධන වැඩසටහන | ගරු සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2025.07.31 වන දින පැවති රැස්වීමේදී සංචාරක ක්ෂේත්‍රයට අදාලව ව්‍යාපෘති යෝජනා ලබා දෙන ලෙස දුන් උපදෙස් පරිදි අම්බලන්තොට තංගල්ල, තිස්සමහරාම යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවලින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති 06 ක් වෙනුවෙන් රු.මි. 17 ක ප්‍රතිපාදන ලැබී ඇති බවත් දැනට එම ප්‍රතිපාදන ප්‍රාදේශිය ලේකම් වරුන්ට ලබා දී ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවත් දැනුම් දෙන ලදි. | අදාල ව්‍යාපෘති කඩිනම් කරන ලෙස පවසන ලදි. | |
| 2.1.7 | **ග්‍රාමීය පාසල් සඳහා ක්‍රිඩා උපකරණ ලබාදීම හා ක්‍රිඩා පිටි සැකසීම.** | ක්‍රිඩා අමාත්‍යාංශය විසින් නිකුත්කර ඇති චක්‍රලේඛය පරිදි දැනටමත් ක්‍රිඩා උපකරණ ලබාදීම සඳහා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු එකඟතාවය යටතේ ලබාදී ඇති පාසල් 168 ක අවශ්‍යතා ලේඛන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතිය යටතේ දැනටමත් ක්‍රිඩා අමාත්‍යාංශයට යොමු කර ඇති බව දැනුම් දෙන ලදි.<br>• එමෙන්ම, චක්‍රලේඛ උපදෙස් පරිදි එක් කලාපයකින් සංවර්ධනය කලයුතු ක්‍රීඩාපිටි සඳහා පහත පරිදි එක් එක් අධ්‍යාපන කලාප වලින් ව්‍යාපෘති ඉදිරිපත් කර ඇති බවත් දැනුම් දෙන ලදි.<br><u>තංගල්ල අධ්‍යාපන කලාපය</u><br>-රුහුණු විජයබා ජාතික පාසල<br>-තලාව මහා විද්‍යාලය | ඇස්තමේන්තු ඉදිරිපත් කර ප්‍රතිපාදන ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි.<br>තවද, අද දින මෙම දිසත්‍රික් සදම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව සහ ඉදිරිපත්කල නව යෝජනා සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |





දිස්ත්‍රික් ලේකම් / දිසාපති

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | <u>හම්බන්තොට අධ්‍යාපන කලාපය</u><br>-වැටිය ධර්මපාල විද්‍යාලය<br>-පන්නෙගමුව රාජකීය විද්‍යාලය<br><u>වලස්මුල්ල අධ්‍යාපන කළාපය</u><br>-හොරේවෙල මහා විද්‍යාලය<br>-මීගස්ආර මහා විද්‍යාලය | | |
| 2.1.8 | පළමු අදියර යටතේ අත්‍යාවශ්‍ය පාලම් ප්‍රතිසංස්කරණය සඳහා රු.මි 200ක් වෙන් කිරීම. | ප්‍රමුඛතාවය මත හඳුනාගත් ප්‍රධාන පාලම් 05 අතුරින් මේ වසර අවසානයට පෙර පල්ලෙකන්ද පාලමේ වැඩ අවසන් කිරීමට කටයුතු කරන බවත් අනෙක් පාලම් දෙකේ වැඩ කොටස් ආරම්භ කිරීමට කටයුතු කරන බවත් ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සූදානම් කරන බවත් දැනුම් දෙන ලදී. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස පවසන ලදී. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය. |
| 2.1.9 | 2025.09.30 දිනට අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම. | එක් එක් ආයතන මඟින් ඉදිරිපත් කරන ලද ප්‍රගතිය ඇමුණුම් අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත. | | |
| 03. | පළාත් සභා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව දැනුවත් කිරීම. | සියළු ව්‍යාපෘති සම්බන්ධව මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු කරන ලද අතර 2025.09.30 දිනට දැනුම් දෙන ලද ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කර ඇත. | | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අමාත්‍යාංශය | අනුමත ප්‍රතිපාදන මුදල රු.මි. | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 586.04 | 239 | 195 | 27 | 40.02 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 385.90 | 143 | 110 | 33 | 78.29 |
| ධීවර අමාත්‍යාංශය | 289.55 | 95 | 93 | 2 | 64.38 |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 127.22 | 67 | 55 | 9 | 27.10 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 450.94 | 87 | 53 | 34 | 48.80 |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 04. | සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු | <u>පාසල් දන්ත චිකිත්සාගාරයක් ආරම්භ කිරීම.</u><br>හම්බන්තොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ පාසල් දන්ත චිකිත්සාගාරයක් නොමැති හෙයින් ලඟාවීමේ පහසුවද සලකාබලා, මිරිජ්ජවිල මහ විද්‍යාලයේ පාසල් දන්ත චිකිත්සාගාරයක් ආරම්භ කිරීමට කාමර පහසුකම් ලබා දෙන්නේ නම් හෝ වෙනත් පාසලක කාමර පහසුකම් ලබා දෙන්නේ නම් සුදුසු බව දැනුම් දෙන ලදී. | අවශ්‍ය පහසුකම් පවතිද යන්න සොයාබලා මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට |
| | | <u>වීරකැටිය රෝහලෙහි තාප්පය ඉදිකරන ස්ථානයේ බෝගසක් පැවතීමෙන් බාධා මතුවීම.</u><br>වීරකැටිය ප්‍රාදේශීය රෝහලෙහි ඉදිරිපස තාප්පය මුළුමනින්ම ඉවත්කර ඇතත් ඉන් කොටසක් පමණක් ඉදිකිරීම සිදුකරන බවත් | තාප්පයේ ඉතිරි කොටස සඳහා කඩිනමින් | ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ඉතිරි කොටස ඉදිනොකිරීමට හේතුව කුමක්දැයි විමසන ලදි. එහිදී ලැබී ඇති ප්‍රතිපාදන වලට පමණක් ඇස්තමේන්තු කර ඇති බවත් එමනිසා කොටසක් පමණක් ඉදිකරණ බවටත් කරුණු ඉදිරිපත් කරන ලදි. තවද, තාප්පය ඉදිකරණ ස්ථානයේ පවතින බෝ ගස මගින් තාප්පයටබාධාවක් බවත් පෙන්වා දෙන ලදි.<br><br>මේ වන විට මෙම බෝ ගස කුඩා අවධියේ පැවතියත් තාප්පය ඉදිකිරීමෙන් පසු ගස විශාලවීමෙන් තාප්පයට හානිවිය හැකි බැවින් මේ අවස්ථාවේම මෙකී ගස ඉවත්කිරීම සුදුසු බවට යෝජනා විය. | ඇස්තමේන්තුවක් අදාල අමාත්‍යාංශයට යොමු කර ප්‍රතිපාදන ලබා ගන්නා ලෙසත් ආපදා කළමනාකරණ අංශය මගින් එම බෝ ගස ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>සහකාර අධ්‍යක්ෂ, ආපදා කළමනාකරණ අංශය |
| | | <u>**ගෝණදෙණිය රෝහලේ සාම්පල් පරීක්ෂණ පහසුකම් ලබා ගැනීම.**</u><br><br>මෙම රෝහලට අදාල සාම්පල් පරීක්ෂාව සඳහා තලාව හෝ තංගල්ල යන රෝහල් වෙත යොමු කර පරීක්ෂා කිරීමට ප්‍රවාහන පහසුකම් නොමැති බවත් එකී ප්‍රවාහන පහසුකම් ලබා දෙන්නේ නම් සේවා පහසුකම් පුළුල් කර හැකි බව දැනුම් දෙන ලදි. | මේ සඳහා ස්ථිර ප්‍රවාහන පහසුකම් ලබා දෙන තෙක් රෝහලේ ගිලන් රථය යොදාගන්නා ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| **05.** | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම. | සියළු ආරක්ෂක කටයුතු ක්‍රියාවට නැංවීම අඛන්ඩව සිදුකරන බවත් සේවා පහසුකම් තවත් වැඩි කිරීම සඳහා සිවිල් ආරක්ෂක බලකාය මගින් නිලධාරී පිරිසක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.<br><br>අද දින විකාශය වූ ප්‍රවෘත්ති මගින් පොලිසියට බඳවාගන්නා ලද ආධුනික පොලිස් නිලධාරීන්ගෙන් 20% ක් | දිස්ත්‍රික්කයේ ආරක්ෂාව සම්බන්ධව අවධානයෙන් කටයුතු කරන ලෙසත් අසිවිල් ආරක්ෂක බලකාය මගින් නිලධාරීන් අනුයුක්ත කර ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් සිදු කරන ලෙසත් පහත කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරන ලෙසත් ඉල්ලීමක් කරන ලදි.<br>• සීනිමෝදර මත්ද්‍රව්‍ය සම්බන්ධ ගැටළුවේ පරීක්ෂණ සිදුකිරීමේදී වැරැද්දට සම්බන්ධ කිසිදු අයෙක් බේරෙන්න අවස්ථාවක් නොවන අයුරින් පරීක්ෂණය සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි,<br>• මේ සම්බන්ධව දැඩියේ අවධානය යොමු කර කටයුතු | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවී ඇති බවට ප්‍රකාශ වූ කරුණු අනුව එය දැඩිසේ අවධානයට ලක්විය යුතු කරුණක් බවට අදහස් ඉදිරිපත් විය.<br><br>යම් ස්ථානයක මරණයක් සිදුවූවිට මරණකරුගේ ඥාතීන්ගෙන් ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට පොලිසිය යොමු වීමක් වාර්තාවන බව දැනුම් දෙන ලද අතර පොලිසිය සඳහා ඊට අවශ්‍ය පහසුකම් ලබා දෙන බව පැහැදිලි කරණ ලදි. | කරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>• සාමාන්‍ය ජනතාව අපහසුතාවයට පත් නොවන අයුරින් සේවාවන් උපරිමයෙන් ලබා දීමට අවශ්‍ය උපදෙස් සියළු නිලධාරීන්ට ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි. | |
| 06. | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත්වී ඇති යෝජනා** | | | |
| 6.1 | ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ සංවර්ධනය සඳහා දිස්ත්‍රික්කය තුළ තෝරාගනු ලැබූ පාසල් ලේඛනය අනුමැතියට ඉදිරිපත් කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද නිර්නායක පදනම්කර ගනිමින් 2025, 2026 සහ 2027 වර්ෂ සඳහා සංවර්ධනයට කලාප මට්ටමින් තොරාගනු ලැබූ පාසල් නාම ලේඛනය සම්බන්ධිකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. | මෙකී තෝරාගනු ලැබූ පාසල් නාම ලේඛනය සඳහා අදාල අනුමැතිය ලබා දෙන ලදි. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් |
| 07. | **සාකච්ඡාකරන ලද වෙනත් කරුණු** | | | |
| 7.1 | හම්බන්තොට කලාපයට අයත් ජාතික පාසල් සඳහා විදුහල්පතිවරුන්ගේ පුරප්පාඩු පිලිබඳව දැනුම් දීම. | හම්බන්තොට කලාපයට අයත් ජාතික පාසල් 07 ක විදුහල්පති හා ගුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීම සඳහා මැදිහත්වීම ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | මේ වන විට මෙකී පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දැනුම් දෙන ලදි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට |
| 7.2 | පළාත් සාහිත්‍ය උත්සවය සඳහා ලමයින් සම්බන්ධ කර ගැනීම අපහසු වීම. | ලමයින් මේ සඳහා සම්බන්ධ කිරීමේදී ආරක්ෂාව සැපයීමේ ගැටළු මතුවීම හේතුවෙන් මේ තත්ත්වය මතුවී ඇති බව පැහැදිලි කරන ලදි.<br>පාසල් සිසුන් සහභාගීකරවීම ගැටළුවක් නොවන බවත් පාසලෙන් බැහැරට සිසුන් ගැනීමේදී ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව විධිමත් තහවුරුවක් අවශ්‍ය බවත් පෙන්වා දෙන ලදි. | අදාල පාර්ශව වගකීමෙන් මැදිහත්වී ලමයින් සඳහා ආරක්ෂාව සැපයීමට අවශ්‍ය පියවර ගෙන මෙම කටයුතු සඳහා ලමයින් සම්බන්ධ කරන ලෙස උපදෙස් දෙන ලදි. | ලේකම්,<br>දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් |
| 7.3 | පිරිවෙන් විද්‍යායතන පිරිවෙන්වල හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවල ඉගනුම ලබන ශිෂ්‍යයාවන් සඳහා මාසික වාර ප්‍රවේශපත්‍ර ලබා දෙන ලෙස ඉල්ලීම | මෙම ආයතනවල ඉගනුම ලබන ගිහි ගැහැණු සිසුන් සඳහා මාසික වාර ප්‍රවේශපත්‍ර ලබාදීම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඇතැම් ඩිපෝවලින් ප්‍රතික්ෂේප කර ඇති බවත් එකී පහසුකම් මෙම පිරිවෙන්වල හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවල ඉගනුම් ලබන ශිෂ්‍යයාවන් සඳහා ද සමානව ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලන ලදි. | සියළු සිසුන්ට සමාන අයිතිවාසිකම් සැපයිය යුතු බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස උපදෙශ් දෙන ලදි. | ඩිපෝ කළමනාකරුවන් |
| 08. | **පසුව ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර ගනුලැබූ තීරණ.** | | | |
| 8.1 | රටතුළ සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා "නිෂ්පාදන යාය" | මෙම කාලය තුළ රටතුළ සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා "නිෂ්පාදන යාය" නමින් ක්‍රියාත්මක වැඩසටහනක් සැලසුම් කර ඇති | සියළු නිලධාරීන්ගේ සහයෝගය මේ සඳහා ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. | සියළු ආයතන ප්‍රධානීන් |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම 2025 /2026 මහකන්නය ප්‍රවර්ධනය කිරීම. | බවත් 2025.09.30 සිට 2025.10.04 දක්වා ඊට අදාල ප්‍රවර්ධන සතියක් පැවැත්වීමට තීරණය කර ඇති බවත් ඊට අදාල දැනුවත් කිරීම සියළු සම්බන්ධීකරණ කමිටු නිලධාරීන් වෙත සිදුකරන ලදි. | | |
| 8.2 | අඟුණකොළපැලැස්ස නගර මධ්‍යය තුළ අඩක් ඉදිකර අතරමඟ නතරකර ඇති වෙළඳ සංකීර්ණය | නාගරික සංවර්ධන අධිකාරියට අයත් මෙම වෙළඳ සංකීර්ණය ඌන උපයෝජිත තත්ත්වයේ පවතින බවත් භාවිතයට නොගන්නා කඩකාමර විශාල ප්‍රමාණයක් හා වැසිකිළි පද්ධතියක් පවතින බවත් මේ සඳහා විශාල මුදලක් වැයකර ඇති බවටද පැහැදිලි කරමින් මේ හේතුවෙන් කලක්තිස්සේ මෙසේ පැවතීම තුළ මෙම ස්ථානය අවභාවිත කිරීම් හා අනවසර කටයුතු සිදුකිරීම් විශාල වශයෙන් වාර්තා වන බව වැඩිදුරටත් පැහැදිලි කරන ලදි.<br>නගරයේ මහජනතාවගේ සුභසිද්ධියට මෙය සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය බවත් මෙය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුකිරීමේ හැකියාවක් නොමැති නම් ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන ලෙසත් එහි ඉදිරි කටයුතු ප්‍රාදේශීය සභාව මඟින් සිදුකල හැකි බවත් දැනුම් දෙන ලදි. | මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මෙකී වෙළඳ සංකීර්ණයේ ඉතිරි වැඩකොටස් සඳහා රු.මි. 32 ඇස්තමේන්තුවකට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට එම කමිටුවට ඉදිරිපත් කිරීමට නියමිත හෙයින් ඊට අදාල කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 8.3 | රුහුණු මාගම්පුර ව්‍යාපෘතිය - නව කෞතුකාගාරය ඉදි කිරීම සම්බන්ධවයි | මධ්‍යම සංස්කෘතික අරමුදල රුහුණු මාගම්පුර ව්‍යාපෘතිය මඟින් නව කෞතුකාගාරය ඉදිකිරීමට සැලසුම් කර ඇති බවත් මීට යෝජිත භූමිය ප්‍රාදේශීය ලේකම් භාරයේ පවතින බවත් එම භූමිය නීත්‍යානුකූලව සම්බන්ධවයි මධ්‍යම සංස්කෘතික අරමුදලට පවරීමෙන් මෙම කෞතුකාගාරය ඉදිකිරීම කඩිනම් කල හැකි බවද පැහැදිලි කරන ලදි. | මෙකී බිම් කොටසට අදාලව තක්සේරුව සඳහා යොමු කර ඇති බවත් ඊට අදාල වාර්තාව ලැබුන පසුව දැනුම් දිය හැකි බව දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහරාමය<br><br>ව්‍යාපෘති කළමනාකරු, තිස්සමහරාම ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, තිස්සමහරාමය |
| 8.4 | "Eco Salt" ව්‍යාපෘතිය සඳහා හම්බන්තොට සංවර්ධන කමිටුවෙන් අවසරය ලබාගැනීම. | Nuwa Enterprises (pvt) LTD විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආර්ථික හා පරිසර හිතකාමී ආකාරයෙන් ලුණු නිපදවීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කිරීමටත් මෙහි දෙවන අදියර ලෙස මේ මඟින්<br>- සංචාරක කර්මාන්තය වර්ධනය,<br>- සූර්ය ශක්ති ජනනය,<br>-සුලඟෙන් විදුලිය නිෂ්පාදනය සැලසුම් කර ඇති බවත් මෙම ව්‍යාපෘති මඟින් පළාතේ රැකියා අවස්ථා වර්ධනය, පාරිසරික ආරක්ෂාව සැපයීම සහ ජාතික ආර්ථිකය සඳහා ඉතිරිකිරීමක් සිදුකිරීමට මෙම ව්‍යාපෘතිය මඟින් හැකිවන බව පැහැදිලි කරමින් මෙකී ව්‍යාපෘතිය සඳහා කමිටුවේ අනුමැතිය ඉල්ලා සිටින ලදි. | අදාල ආයතන සමඟ සාකච්ඡා කර පැහැදිලි අධ්‍යයනයකින් අනතුරුව එම කරුණු මත අනුමැතිය ලබා දීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදි. | ව්‍යාපෘති කළමනාකාර අධ්‍යක්ෂක, |



බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.5 | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය සහ එහි කාර්යභාරයන් පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සහ අදාල අනෙකුත් පාර්ශවයන් දැනුවත් කිරීම. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන එහි කාර්යභාර්ය පිළිබඳව විධිමත් හා විස්තරාත්මක පැහැදිලිකිරීමක් සිදුකරන ලද අතර රැකියාල නියුතුවූවන් සඳහාද අධ්‍යයන කටයුතු සිදුකල හැකි බවත් එසේම ශිෂ්‍යත්ව පහසුකම් පවතින බවත් අනෙක් විශ්වවිද්‍යාල හා සමාන උපාධියක් ලබාගත හැකි බවද වැඩිදුරටත් පැහැදිලි කර මෙම සියළු වරප්‍රසාද ලබාගැනීම සඳහා නිලධාරීන් හා මහජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය පවතින බවත් ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | සියළු ආයතන මඟින් දැනුවත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | සියළුම ආයතන ප්‍රධානීන්<br><br>සහකාර අධ්‍යක්ෂ, අම්බලන්තොට අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය |
| 8.6 | සූරියවැව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණ දැනුම් දීම - වනජීවී කාර්යාලය සඳහා වාහන පහසුකම් සලසා ගැනීම. | වනජීවී දෙපාර්තමේන්තු නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවන බවට කරුණු ඉදිරිපත් වූ අතර ඊට අවශ්‍ය පහසුකම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා දිය හැකි බව ද දන්වන ලදි. | එසේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අවශ්‍ය පහසුකම් ලබා ගෙන කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>සහකාර අධ්‍යක්ෂ, වනජීවී දෙපාර්තමේන්තුව |
| 8.7 | පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන යටතේ රොට වැවේ සහ ඌරණිය වැවේ රොන් මඩ ඉවත්කර ලවණ අධික කුඹුරු සඳහා ලබා දීම. | නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බවත් මේ සඳහා රු.මි. 1.3 ක් වියදම් දැරීමට සූදානම් බවත් දැනටමත් එක් ගොවිමහතෙකු විසින් මෙම ක්‍රමය අනුගමනය කරන බවද දැනුම් දෙන ලදි. | පරීක්ෂණයක් ලෙස නොව ඵලදායී ව්‍යාපෘතියක් ලෙස සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පළාත්) |
| 8.8 | පර්යේෂණ ක්ෂේත්‍රයන්ට වන අලින්ගෙන් සිදුවන හානි වලක්වා ගැනීම. | පසුගිය දින 10 ක කාලසීමාව තුළ අවස්ථා දෙකකදී වන අලින් ආයතනික භූමියට පැමිණ හානි සිදුකර ඇති බවත් ඉදිරියේදී ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රවලට හානි සිදුවීමේ දැඩි අවධානමක් පවතින බවටත් වන අලින් මෙම භූමියේ කොතනක ගැවසෙනවාද යන්න නිශ්චිත නොමැති වීමද මෙකී අවධානමට හේතුවන බව පැහැදිලි කරන ලදි. | මෙම ගැටලුව විසඳගැනීම සඳහා පර්යේෂණ ක්ෂේත්‍රයට ගැලපෙන ලෙස සුදුසු යෝජනා ඉදිරිපත් කරන ලෙසත් එකී යෝජනා අනුව බාධා ඉවත් කිරීම සඳහා අදාල ආයතන මඟින් අවශ්‍ය සහයෝගය ලබා දිය හැකි බවත් දැනුම් දෙන ලදි. | අතිරේක අධ්‍යක්ෂ, මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය |
| 8.9 | වලවෙ ගඟෙහි ජලය අපිරිසිදු වීම. | සෙවනගල සීනි කර්මාන්තශාලාවේ ඉවත්කරන ලද අපද්‍රව්‍ය වලවෙ ගඟට මුසුවීම හේතුවෙන් අම්බලන්තොට ජල පවිත්‍රාගාරයේ කටයුතු නවතා දැමීමට සිදුවීම නිසා ප්‍රදේශ කිහිපයකට ජලය හිඟවීමෙන් මහජනතාව විශාල ලෙස පීඩනයකට පත්වූ බවත් ඒ අවස්ථාවේ සභාවත් සතු බවුසර් හා ට්‍රැක්ටර් මඟින් හැකි අයුරින් ජලය බෙදාහැරීම සිදුකලත් එකී ප්‍රදේශවල ජල අවශ්‍යතාවය සම්පූර්ණ කල නොහැකි වූ බව පැහැදිලි කරන ලදි. එසේම, මෙවැනි දේවල් නැවත සිදු නොවීමටත් සිදුවූ කාරණය සම්බන්ධව පැහැදිලි තාවයක් අවශ්‍ය බවත් සාකච්ඡා විය | වලවෙ ගඟට අපද්‍රව්‍ය මුසුවීම සම්බන්ධව පැහැදිලි පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා ගතයුතු බවත් ඉදිරියේදී මෙවැනි කටයුතු සිදු නොවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස මොණරාගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත දැනුම් දීමට තීරණය කරණ ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>කළමනාකරු, ජලසම්පාදන මණ්ඩලය |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.10 | කටුවන කොටුව ආසන්නයට මගී ආවරණයක් ඉදිකිරීම. | සංචාරක ආකර්ෂණය ඇති ස්ථානයක් ලෙස සැලකෙන මෙම බලකොටුව ආසන්නයේ මගී ආවරණයක් නොමැතිවීමෙන් සංචාරකයින් මෙන්ම මගීන් දැඩි අපහසුතාවයකට ලක්වන බවත් මගී ආවරණය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලැබී ඇතත් එම කාර්ය මේ දක්වා ඉටුකර ගැනීමට නොහැකි බවට කරුණු ඉදිරිපත් විය. මෙම බලකොටුව පුරාවිද්‍යාත්මක වටිනාකමක් පවතින බවත් ඒ පිළිබඳව පවතින නීතිමය තත්ත්වය තුළ කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බවටත් කරුණු ඉදිරිපත් විය. | විධිමත් අධ්‍යයනයක් සිදුකර වාර්තා කරන ලෙසත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙතින් මේ සම්බන්ධව අදාල උපදෙස් ලබා ගන්නා ලෙසත් තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>සභාපති, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 8.11 | කටුවැව ප්‍රතිසංස්කරණය කිරීම. | පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය මගින් ASM Construction ආයතනය වෙත මෙම ව්‍යාපෘතිය පවරා ඇති අතර මෙකී ව්‍යාපෘති යේ කටයුතු මේ දක්වා සිදුකර නොමැති බවත් අවස්ථා කිහිපයකදී ඔවුන් වෙත දැනුම් දී ඇතත් කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ඉදිරිකටයුතු සහ මෙම කොන්ත්‍රාත්කරු සම්බන්ධව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරන ලෙසත් පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත දැනුම් දීමට තීරණය වියත | දිස්ත්‍රික් ලේකම්<br><br>පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, දකුණු පළාත<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 8.12 | දක්ෂිණ පුනරුද සාහිත්‍ය කළා මහෝත්සවය | 2025 ඔක්තෝම්බර් මස 10 සහ 11 දිනවල හම්බන්තොට වෙරළ උද්‍යානයේදී දකුණු පළාත් සංස්කෘතික හා කළා කටයුතු අමාත්‍යාංශය මගින් සාහිත්‍යමය වැඩසටහන් රාශියක් ඔස්සේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතින බවත් සියළු වැඩසටහන් නොමිලේ නැරඹීමට අවස්ථාවක් උදාකර ඇති බවත් ඒ සඳහා සහභාගී වන ලෙස මහජනතාව දැනුවත් කරන ලෙසත් ඉල්ලීම් කරන ලදි. | මෙකී වැඩසටහන සාර්ථකව සිදුකිරීම සඳහා මේ පිළිබඳව සියළු පාර්ශව දැනුවත් කරමින් නොමිලේ ලබාදියහැකි සෑම සේවාවක්ම ඒ ඒ ආයතනවලින් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික්කයේ සියළුම ආයතන ප්‍රධානීන් |

යෝජිත මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා අදාල සියළුම නිලධාරීන්ගේ පැමිණීම අනිවාර්ය බවත් අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලූ දෙනාටම ස්තූතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 1.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2025 ඔක්තෝම්බර් මස 08....................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.

ඇමුණුම - 01

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල 2025.09.20 දිනට ප්‍රගතිය

| අ.අ | ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | 2025 වර්ෂයට වෙන්කළ මුදල (රු.මි.) | 2025.09.20 දිනට | |
|---|---|---|---|---|---|
| | | | | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු. මි. |
| 1 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 352 | 1,439.37 | 128 | 260.00 |
| 2 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 2 | 31.75 | - | 12.49 |
| 3 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 37 | 98.26 | 1 | 0.30 |
| 4 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 103 | 276.78 | 14 | 49.00 |
| 5 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 8 | 39.56 | - | 1.64 |
| 6 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) | 7 | 4.18 | 2 | 1.48 |
| 7 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 1 | 1.90 | - | 1.30 |
| 8 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ( නාගරික සංවර්ධන අධිකාරිය) | 1 | 35.00 | 0 | - |
| 9 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය (නිවාස සංවර්ධන අධිකාරිය) | 3 | 180.00 | | 102.37 |
| 10 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 13 | 56.28 | 2 | 38.00 |
| 11 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 62 | 801.00 | | - |
| 12 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 33 | 113.49 | 0 | |
| 13 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (දකුණු කළාපය) - පරිසර අමාත්‍යාංශය | 24 | 29.31 | 12 | 10.36 |
| 14 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - පරිසර අමාත්‍යාංශය | 11 | 38.49 | | 6.33 |
| 15 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - පරිසර අමාත්‍යාංශය | 33 | 360.87 | 0 | 31.36 |
| 16 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව - පරිසර අමාත්‍යාංශය | 2 | 15.35 | | 5.37 |
| 17 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර් පළාත්) | 17 | 45.31 | 9 | 0.82 |
| 18 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (පළාත්) | 37 | 223.65 | 17 | 39.32 |
| 19 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක | 2 | 0.16 | 1 | |
| 20 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | 38 | 470.11 | 11 | 181.81 |
| එකතුව | | 786 | 4,260.82 | 197 | 741.95 |

විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට